## නීතිය ක්‍රියාත්මක කරන ආයතන [පොලිසිය හෝ ත්‍රිවිද හමුදාව] විසින් අත්අඩංගුවට ගත් පුද්ගලයන් සතු අයිතිවාසිකම්

*මූලාශ්‍රය: 2018 අංක 5 දරන බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත*

**1. නිදහස අහිමි කළ තැනැත්තකු යනු කවුරුද?**

යම් තැනැත්තෙකුගෙ කැමැත්තෙන් තොරව එම තැනැත්තාව විශේෂිත තැනක රඳවා තබා ගන්නේ නම් එම තැනැත්තා නිදහස අහිමි කල තැනැත්තකු වේ [25 වගන්තිය]

**2. නිදහස අහිමි කිරීම සහ අත්අඩංගුවට ගැනීම අයත්වේද?**
ඔව්.

**3. නිදහස අහිමි කළ තැනැත්තකුට ඇති අයිතිවාසිකම් මොනවද?**

- පොලිස් නිලධාරියා වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීම වෙනත් ආකාරයකින් යුක්ති සහගත වුවද, ඔහු අත්අඩංගුවට ගෙන ඇති චෝදනාවල ස්වභාවය පිළිබඳව සැකකරුට දැනුම් නොදෙන්නේ නම් අත්අඩංගුවට ගැනීම නීති විරෝධී ය. [*Muttusamy v Kannangara (1951) 52 N.L.R 324* නඩු තීන්දුව]
- කිසිම පුද්ගලයෙකු රහසිගතව රඳවා තබා නොගත යුතුය. [15 (1) වගන්තිය]
- ලිඛිත නීතියක් මගින් ස්ථාපිත කර ඇති කොන්දේසි වලට යටත්ව, නිදහස අහිමි වූ ඕනෑම පුද්ගලයෙකුට ඔහුගේ/ඇයගේ ඥාතීන්, නීතිඥවරයා හෝ ඔහු/ඇය කැමති වෙනත් ඕනෑම පුද්ගලයෙකු සමඟ සන්නිවේදනය කිරීමට අයිතියක් ඇත. [15 (2) වගන්තිය]

**4. නිදහස අහිමි වූ පුද්ගලයෙකුගේ ඥාතීන්ට, නියෝජිතයින්ට සහ නීතිඥයින්ට පහත තොරතුරු සඳහා අයිතිය ඇත [16 (1) වගන්තිය]**
- නිදහස අහිමි කිරීමට නියෝග කළ පුද්ගලයා හෝ අධිකාරිය;
- පුද්ගලයාගේ නිදහස අහිමි වූ සහ නිදහස අහිමි වූ ස්ථානයට ඇතුළත් කළ දිනය, වේලාව සහ ස්ථානය;
- පුද්ගලයාගේ නිදහස අහිමි කිරීම අධීක්ෂණය සඳහා වගකිව යුතු අධිකාරිය පිලිබඳ තොරතුරු ;
- නිදහස අහිමි වූ පුද්ගලයා සිටින ස්ථානය, නිදහස අහිමි කල පුද්ගලයා වෙනත් ස්ථානයකට මාරු කිරීමේදී, එම තැනැත්තා මාරු කල ස්ථානය සහ එම මාරුකිරීමට වගකිව යුතු අධිකාරිය / පුද්ගලන්ගේ විස්තර ;
- නිදහස අහිමි වූ පුද්ගලයා නිදහස් කරන ලද්දේ නම් නිදහස් කළ දිනය, වේලාව සහ ස්ථානය;
- නිදහස අහිමි පුද්ගලයාගේ සෞඛ්‍ය තත්ත්වය සම්බන්ධ තොරතුරු;

[1] http://www.documents.gov.lk/files/act/2018/3/05-2018_S.pdf

- නිදහස අහිමි කල අවස්ථාවේදී පුද්ගලයකු මියගියේ නම් එම මරණයට හේතුව සහ දේහය ගමනාන්තය.

නිදහස අහිමි වූ තැනැත්තකුගේ ඕනෑම ඥාතියකු, නියෝජිතයකු හෝ නීතිඥයකු මෙන්ම විමර්ශනයට සහභාගී වන පුද්ගලයන් ද යම් බිය ගැන්වීමක්, අනිසි ආකාරයෙන් සැලකීමක් හෝ යම් තහනමකට ලක්කිරීමක්, නිදහස අහිමි වූ පුද්ගලයකු පිළිබඳව තොරතුරු සෙවීමක් කරන විට නොකළ යුතුය [16 (2) වගන්තිය]

**5. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවේ පසුවන හෝ රඳවා සිටින පුද්ගලයෙකුට නීතිඥයෙකුගේ සේවය ලබාගැනීමට අයිතියක් තිබේද?**

ඔව්, පාර්ලිමේන්තුව විසින් මෑතකදී සම්මත කරන ලද සංශෝධනයට අනුව [PTA හි S.10A (1)] ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රිමාන්ඩ් හෝ රඳවා සිටින පුද්ගලයෙකුට;

- නීතිඥයෙකු හමු වීමට සහ නීතිඥයෙකු සමග කථා කිරීමට [ප්‍රවේශ වීමට] අයිතිය ඇත සහ
- නීතිඥයෙකුගේ නියෝජනය ලැබීමට අයිතිය ඇත.

මෙම අයිතිවාසිකම් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ සාදන ලද රෙගුලාසි මගින් හෝ වෙනත් ලිඛිත නීතියකු දක්වා ඇති කොන්දේසි වලට පමණක් යටත් වේ.

**6. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවේ පසුවන හෝ රඳවා සිටින පුද්ගලයෙකුට තම පවුලේ සාමාජිකයන් සමග කථා කිරීමට / ඔවුන් සමග සන්නිවේදනය කිරීමට අයිතියක් තිබේද?**

ඔව්, 2018 අංක 5 දරන බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනතේ ඇති අයිතිවාසිකම් එවැනි පුද්ගලයන්ටද අදාළ වේ.

මීට අමතරව, පාර්ලිමේන්තුව විසින් මෑතකදී සම්මත කරන ලද සංශෝධනයට අනුව [PTA හි S.10A (2)], ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රිමාන්ඩ් කරන ලද හෝ රඳවාගෙන සිටින පුද්ගලයෙකුට ලිඛිත නීතියේ දක්වා ඇති පරිදි ඔහුගේ ඥාතීන් සමඟ සන්නිවේදනය කිරීමට අයිතියක් ඇත.

**7. මා දන්නා කෙනෙකු අත් අඩංගුවට ගත්තොත් / රඳවා තබා ගත්තොත් මා කුමක් කළ යුතුද?**

- අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ ඉහත 4 හි දක්වා ඇති තොරතුරු විමසන්න.
- අත්අඩංගුවට ගන්නා නිලධාරියාගේ නම සහ පුද්ගලයා රැගෙන යන ස්ථානය ලබා ගන්න.
- ඔවුන් ගමන් කරන වාහනයේ අංකය සටහන් කරන්න.
- උපකාර සඳහා නීතිඥයෙකු අමතන්න. [ශ්‍රී ලංකා නීතිඥය සංගමයේ වද හිංසාව පිටු දැකීම සඳහාවූ විශේෂ ඇමතුම් අංකය 0777144004]

- පැමිණිල්ලක් ලියාපදිංචි කිරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්ෂණික ඇමතුම් අංකය [1996] අමතන්න.

**8. යම් පුද්ගලයෙකු රඳවා තබා ගන්නා නීතිය බලාත්මක කිරීමේ බලධාරීන්ගේ රාජකාරී මොනවාද?**

- ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට නිදහස අහිමි කල පුද්ගලයන් සිටින ස්ථාන වෙත ප්‍රවේශය ලබා දිය යුතුය [15 (3) වගන්තිය]
- නිදහස අහිමි කල පුද්ගලයින් සම්බන්ධයෙන් යාවත්කාලීන නිල රෙජිස්ටරයක් සහ සම්පාදනය කිරීම [15 (4) වගන්තිය]
- මෙම ලේඛන සහ වාර්තා ඕනෑම අධිකරණ හෝ වෙනත් නිසි බලධාරියෙකුට හෝ නීතියෙන් ඒ සඳහා බලය පවරන ලද ආයතනයකට ඉල්ලීමක් මත කඩිනමින් ලබා දිය යුතුය. [15 (4) වගන්තිය]
- මෙම ලේඛන සහ වාර්තාවල පහත සඳහන් කරුණු ඇතුලත් කල යුතුය [15 (4) වගන්තිය]

❖ නිදහස අහිමි වූ තැනැත්තාගේ අනන්‍යතාවය;
❖ යම් තැනැත්තකුගේ නිදහස අහිමි කළ සහ නිදහස අහිමි කළ දිනය, වේලාව සහ ස්ථානය;
❖ එම තැනැත්තාගේ නිදහස අහිමි කළ අධිකාරියේ අනන්‍යතාවය;
❖ නිදහස අහිමි කිරීමට අණ දුන් අධිකාරිය සහ නිදහස අහිමි කිරීමට හේතු;
❖ නිදහස අහිමි කිරීම අධීක්ෂණය කිරීම සඳහා වගකිව යුතු අධිකාරිය;
❖ නිදහස අහිමි කළ ස්ථානය, නිදහස අහිමි කළ ස්ථානයට ඇතුළු කළ දිනය හා වේලාව සහ නිදහස අහිමි කිරීමේ ස්ථානය සඳහා වගකිව යුතු අධිකාරිය;
❖ නිදහස අහිමි කළ තැනැත්තාගේ සෞඛ්‍ය තත්ත්වයට අදාළ තොරතුරු;
❖ නිදහස අහිමි කර තිබූ කාලය තුළ මරණය සිදු වී නම්, මරණය සිදු වූ අවස්ථාගත කරුණු සහ හේතුව සහ දේහයේ ගමනාන්තය;
❖ නිදහස අහිමි වූ තැනැත්තා නිදහස් කළ හෝ වෙනත් නිදහස අහිමි කළ ස්ථානයකට මාරු කළ දිනය හා වේලාව, නිදහස අහිමි කළ තැනැත්තා මාරු කරනු ලැබූ නිදහස අහිමි කළ ස්ථානයේ ගමනාන්තය සහ මාරු කිරීමට වගකිව යුතු අධිකාරිය.